# සතිපතා ආර්ථික දර්ශක

2020 මැයි 15



සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

සලකා බලන කාලපරිච්ඡේදය (2020.05.09 සිට 2020.05.15 දක්වා කාලය) තුළ දී බොරතෙල් මිල ගණන් මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. සතිය මැද දී ඔපෙක් සංවිධානය විසින් නිකුත් කරන ලද පහළ මට්ටමක ඉල්ලුම් පුරෝකථන හේතුවෙන් මිල ගණන් පහළ ගියේය. 2020 දෙවන භාගයේ දී ගෝලීය බොරතෙල් තොග අඩු වනු ඇතැයි කෙරුණු පුරෝකථන සහ බොරතෙල් නිෂ්පාදකයින් විසින් සැපයුම් කප්පාදුවකට යොමුවීම හේතුවෙන් බොරතෙල් මිල ගණන් ඉහළ ගියේය. සමස්තයක් ලෙස මෙම කාල සීමාව තුළ දී, බ්‍රෙන්ට් මිල සහ ඩබ්ලිව්.ටී.අයි. මිල, බැරලයකට එ.ජ. ඩොලර් 0.62 කින් සහ බැරලයකට එ.ජ. ඩොලර් 3.22 කින් ඉහළ ගියේය.

පැවති වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් 2020 වසරේ පළමු මාස දෙක තුළ දී දේශීය තේ නිෂ්පාදනය පෙර වසරට සාපේක්ෂව පහළ ගියේය. අඩු මට්ටමක පැවති වෙළඳ පොළ මිල ගණන් වලට ප්‍රතිචාර දක්වමින් රබර් නිෂ්පාදනය පහළ ගිය අතර 2019 වසරේ මුල් භාගයේ දී පැවති අයහපත් කාලගුණික තත්ත්වයන්ගේ පසු බලපෑමෙන් පොල් නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහළ ගියේය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2020 මැයි මස 15 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 10 කින් සියයට 9.31 ක් දක්වා පහළ ගියේය.

මුදල් සංසරණයේ ඉහළ යාම සහ මහ බැංකුවේ ඇති වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් ඉහළ යන ලදී.

සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 94.826 ක අතිරික්තයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 67.644 ක අතිරික්තයක් විය.

2020 මාර්තු මාසයේදී පුළුල් මුදල් සැපයුමේ (M2b) වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය සියයට 11.6 ක් විය.
2020 මාර්තු මාසයේදී, බැංකු පද්ධතිය මගින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 270.4 කින් ඉහළ ගියේය.
රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද ණය 2020 මාර්තු මාසයේදී රුපියල් බිලියන 35.7 කින් ඉහළ ගියේය.
පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය 2020 මාර්තු මාසයේදී රුපියල් බිලියන 120.1 කින් ඉහළ ගියේය.

2020 මාර්තු මස 20 දින හා සැසඳීමේ දී 2020 මැයි මස 15 වන දින වනවිට , සමස්ත කොටස් මිල දර්ශකය සියයට 2.90 කින් 4,439.04 දක්වා පහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 9.85 කින් 1,755.51 දක්වා පහළ ගියේය

## විදේශීය අංශය

2020 වසරේ මැයි මස 15 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 3.4 කින් අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් රුපියල, ස්ටර්ලිං පවුමට සාපේක්ෂව සියයට 3.9 කින්, යුරෝවලට සාපේක්ෂව සියයට 0.3 කින් සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 2.2 කින් අතිප්‍රමාණය වූ අතර, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 4.6 කින් අවප්‍රමාණය විය.

ඉන්දියාව, එක්සත් රාජධානිය, රුසියාව, ජර්මනිය සහ චීනය සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන මූලාශ්‍ර පහ වූ අතර, එම රටවල් 2020 අප්‍රේල් මාසය දක්වා වු මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 50.2 ක් සඳහා දායක විය.

2020 වසරේ පළමු මාස දෙක තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,993 ක් දක්වා සියයට 1.3 කින් පහත වැටුණු අතර, මේ සඳහා තේ (-6.2%), ආහාර, පාන වර්ග හා දුම්කොළ (-18.6%), රබර් නිෂ්පාදිත (-5.7%) සහ කුළුබඩු (-32.4%) අපනයන ආදායම පහත වැටීම හේතු විය. 2020 වසරේ පළමු මාස දෙක තුළ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,298 ක් දක්වා සියයට 6.8 කින් ඉහළ ගිය අතර, ඉන්ධන (16.3%), කිරි නිෂ්පාදිත (168.3%), එළවළු (48.3%) සහ පෞද්ගලික රථවාහන (19.7%) ආනයන ඉහළ යෑම මේ සඳහා හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වසරේ පළමු මාස දෙක තුළ දී වෙළඳ හිඟය 2019 වසරේ පළමු මාස දෙක තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,069 සිට එ.ජ. ඩොලර් මිලියන 1,304ක් දක්වා පුළුල් විය.

අපනයන යටතේ වර්ග කර ඇති සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන මිල ගණන් පහත වැටීම හේතුවෙන් 2020 වසරේ පෙබරවාරි මාසයේ දී අපනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 4.2 කින් පහත වැටුණි. 2020 වසරේ පෙබරවාරි මාසයේ දී ආනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 0.8 කින් පහත වැටුණු අතර මේ සඳහා අන්තර් භාණ්ඩ මිල ගණන් පහළ යෑම හේතු විය. මේ අනුව, 2020 වසරේ පෙබරවාරි මාසයේ දී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 115.7 ක් දක්වා සියයට 3.5 කින් පහත වැටුණි.

තේ සඳහා සාමාන්‍ය මිල (කොළඹ තේ වෙන්දේසියෙහි මිල) 2019 වසරේ පෙබරවාරි මාසයේ පැවති කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 3.26 සිට 2020 වසරේ පෙබරවාරි මාසයේ දී කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 3.33 ක් දක්වා ඉහළ ගියේය.
2020 වසරේ පෙබරවාරි මාසයේ දී සහල්, තිරිඟු හා බොරතෙල් ආනයන මිල ගණන් 2019 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 3.6 කින්, සියයට 11.7 කින් හා සියයට 7.2 කින් පහත වැටුණු අතර, සීනි ආනයන මිල ගණන් සියයට 9.3 කින් ඉහළ ගියේය.

# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක

| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) | මාර්තු 2020 | මාසයකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - (ජා.පා.මි.ද.) | 135.2 | 137.0 | 126.4 |
| මාසික ප්‍රතිශත වෙනස % | (1.3) | 0.0 | (0.2) |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 4.9 | 4.5 | 1.7 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 7.0 | 8.1 | 2.9 |
| මූලික උද්ධමනය - (ජා.පා.මි.ද.) | 136.0 | 135.8 | 131.8 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 5.2 | 5.5 | 3.3 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 3.2 | 3.4 | 5.8 |
| **කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100)** | **අප්‍රේල් 2020** | **මාසයකට පෙර** | **වසරකට පෙර** |
| මතුපිට උද්ධමනය - (කො.පා.මි.ද.) | 133.6 | 133.4 | 127.0 |
| මාසික ප්‍රතිශත වෙනස % | 0.1 | (0.9) | 0.3 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 4.8 | 4.7 | 4.1 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 5.2 | 5.4 | 4.5 |
| මූලික උද්ධමනය- (කො.පා.මි.ද.) | 137.2 | 136.9 | 133.1 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 4.7 | 4.9 | 4.2 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 3.1 | 2.9 | 5.5 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව







## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ (අ)

| ආහාර අයිතමය | තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | |
| **සහල්** | | | | | | | | |
| සම්බා | 98.00 | 98.00 | 97.00 | 82.00 | ලැනො. | ලැනො. | ලැනො. | 90.00 |
| රතු කැකුළු | 88.00 | 90.00 | 92.00 | 68.00 | ලැනො. | ලැනො. | ලැනො. | 75.00 |
| **එළවළු** | | | | | | | | |
| බෝංචි | 88.00 | 96.67 | 50.00 | 204.00 | ලැනො. | ලැනො. | ලැනො. | 246.00 |
| ගෝවා | 41.00 | 41.67 | 51.25 | 54.20 | ලැනො. | ලැනො. | ලැනො. | 85.00 |
| කැරට් | 57.00 | 60.00 | 86.67 | 110.00 | ලැනො. | ලැනො. | ලැනො. | 144.00 |
| තක්කාලි | 46.00 | 45.00 | 41.25 | 98.00 | ලැනො. | ලැනො. | ලැනො. | 128.00 |
| වට්ටක්කා | 40.00 | 40.00 | 48.75 | 56.80 | ලැනො. | ලැනො. | ලැනො. | 85.00 |
| පතෝල | 60.00 | 50.00 | 53.33 | 134.00 | ලැනො. | ලැනො. | ලැනො. | 178.00 |
| වම්බටු | 54.00 | 50.00 | 51.25 | 89.00 | ලැනො. | ලැනො. | ලැනො. | 126.00 |
| **අනෙකුත් ආහාර** | | | | | | | | |
| රතු ළූණු (දේශීය) | 241.00 | 230.00 | 275.00 | 122.00 | ලැනො. | ලැනො. | ලැනො. | 156.00 |
| ලොකු ළූණු (ආනයනික) | 56.00 | 57.50 | 113.75 | 58.60 | ලැනො. | ලැනො. | ලැනො. | 77.00 |
| අර්තාපල් (දේශීය) | 145.00 | 131.67 | 150.00 | 147.00 | ලැනො. | ලැනො. | ලැනො. | 170.00 |
| වියළි මිරිස් (ආනයනික) | 380.00 | 413.33 | 612.50 | 270.00 | ලැනො. | ලැනො. | ලැනො. | 320.00 |
| පරිප්පු (ඉන්දියානු) | 160.50 | 160.00 | 155.00 | 108.00 | ලැනො. | ලැනො. | ලැනො. | 120.00 |
| බිත්තර (සුදු) | 12.00 | 11.00 | 11.00 | 14.50 | ලැනො. | ලැනො. | ලැනො. | 15.50 |
| පොල් (ගෙඩියක මිල) | 67.50 | 68.33 | 72.50 | 40.00 | ලැනො. | ලැනො. | ලැනො. | 47.60 |
| අමු මිරිස් | 89.00 | 80.00 | 130.00 | ලැනො. | ලැනො. | ලැනො. | ලැනො. | ලැනො. |
| දෙහි | 475.00 | 383.33 | 150.00 | ලැනො. | ලැනො. | ලැනො. | ලැනො. | ලැනො. |
| **මාළු (ආ)** | | | | | | | | |
| කෙලවල්ලා | 590.00 | 483.33 | 440.00 | 662.50 | ලැනො. | ලැනො. | ලැනො. | 950.00 |
| බලයා | 370.00 | 200.00 | 275.00 | 366.00 | ලැනො. | ලැනො. | ලැනො. | 466.00 |
| සාලයා | 234.00 | 160.00 | 246.00 | 186.00 | ලැනො. | ලැනො. | ලැනො. | 240.00 |
| පරව් | 570.00 | 450.00 | 400.00 | 670.00 | ලැනො. | ලැනො. | ලැනො. | 970.00 |

(අ) 2020 මාර්තු 27 වැනි දා සිට පිටකොටුව වෙළඳපොළෙහි සිල්ලර වෙළඳ කටයුතු සිදු නොවුණි.

(ආ) 2020 මාර්තු 27 වැනි දා සිට පෑලියගොඩ ධීවර වෙළඳපොළෙහි සිල්ලර වෙළඳ කටයුතු සිදු නොවුණි.

ලැනො. - ලැබී නොමැත.

## පිටකොටුව වෙළඳපොළ- සිල්ලර මිල (අ)



















(අ) 2020 මාර්තු 27 වැනි දා සිට පිටකොටුව වෙළඳපොළෙහි සිල්ලර වෙළඳ කටයුතු සිදු නොවුණි .

### 1.2.2 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සාමාන්‍යය මිල ගණන් - මෙම සතිය | |
|---|---|---|
| | තොග මිල | සිල්ලර මිල |
| **සහල්** | | |
| සම්බා | 90.00 | 94.00 |
| රතු කැකුළු | ලැනො. | ලැනො. |
| **එළවළු** | | |
| බෝංචි | 95.50 | 115.50 |
| ගෝවා | 33.50 | 53.50 |
| කැරට් | 65.50 | 85.50 |
| තක්කාලි | 55.00 | 75.00 |
| වට්ටක්කා | 30.70 | 50.70 |
| පතෝල | 46.00 | 66.00 |
| වම්බටු | 59.50 | 79.50 |
| අළු කෙසෙල් | 51.25 | 71.25 |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (දේශීය) | 246.10 | 260.60 |
| ලොකු ළූණු (දේශීය) | 53.70 | 63.70 |
| අර්තාපල් (දේශීය) | 132.50 | 143.00 |
| වියළි මිරිස් (ආනයනික) | 367.50 | 377.50 |
| පොල් (ගෙඩියක මිල) | 55.20 | 60.80 |

### 1.2.4 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| සම්බා | 96.40 | 98.00 | 97.00 | 82.70 |
| සුදු කැකුළු | 92.70 | 92.83 | 90.25 | 75.90 |
| රතු කැකුළු | 93.80 | 97.00 | 89.00 | 67.00 |
| නාඩු | 94.90 | 96.67 | 94.38 | 80.50 |

### 1.2.3 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය (අ)

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| **සහල්** | | |
| සම්බා | 90.00 | ලැනො. |
| රතු කැකුළු | ලැනො. | ලැනො. |
| **එළවළු** | | |
| බෝංචි | 122.00 | ලැනො. |
| ගෝවා | 72.00 | ලැනො. |
| කැරට් | 91.00 | ලැනො. |
| තක්කාලි | 64.00 | ලැනො. |
| වට්ටක්කා | 69.00 | ලැනො. |
| පතෝල | 126.00 | ලැනො. |
| වම්බටු | 89.00 | ලැනො. |
| අළු කෙසෙල් | 86.00 | ලැනො. |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (ආනයනික) | ලැනො. | ලැනො. |
| ලොකු ළූණු (ආනයනික) | 70.00 | ලැනො. |
| අර්තාපල් (දේශීය) | 102.00 | ලැනො. |
| අර්තාපල් (ආනයනික) | 176.00 | ලැනො. |
| වියළි මිරිස් (ආනයනික) | 500.00 | ලැනො. |
| පරිප්පු | 170.00 | ලැනො. |
| සුදු සීනි | 118.40 | ලැනො. |
| බිත්තර (සුදු) (එකක මිල) | 13.20 | ලැනො. |
| පොල් (ගෙඩියක මිල) | 73.10 | ලැනො. |
| අමු මිරිස් | 146.00 | ලැනො. |
| **මාළු** | | |
| කෙලවල්ලා | 1012.00 | ලැනො. |
| බලයා | 466.67 | ලැනො. |
| සාලයා | 342.00 | ලැනො. |
| පරව් (පොඩි) | 1024.00 | ලැනො. |

(අ) 2020 මාර්තු මස 25 වැනි දා සිට නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානයෙහි සිල්ලර වෙළඳ කටයුතු සිදු නොවුණි .
ලැනො. - ලැබී නොමැත.

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2010 ස්ථාවර මිල අනුව ) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | වාර්ෂික | | සිව්වන කාර්තුව | |
|---|---|---|---|---|
| | 2018(අ)(ආ) | 2019 (අ) | 2018(අ)(ආ) | 2019 (අ) |
| කෘෂිකාර්මික | 6.5 | 0.6 | 8.2 | (4.1) |
| කාර්මික | 1.2 | 2.7 | (3.4) | 1.4 |
| සේවා | 4.6 | 2.3 | 4.2 | 2.7 |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | (0.6) | 2.6 | (0.4) | 3.4 |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **3.3** | **2.3** | **1.9** | **2.0** |

(අ) තාවකාලික (ආ) සංශෝධිත




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | ඒකකය | 2020 ජන.-පෙබ.(අ) | 2019 ජන.-පෙබ.(ආ) | % වෙනස |
|---|---|---|---|---|
| තේ | (කි.ග්‍රෑ. මිලියන) | 39.89 | 45.07 | (11.50) |
| රබර් | (කි.ග්‍රෑ. මිලියන) | 12.86 | 14.29 | (10.01) |
| පොල් | (ගෙඩි මිලියන) | 467.42 | 500.96 | (6.69) |

(අ) තාවකාලික (ආ) සංශෝධිත




## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | පෙබරවාරි | | % වෙනස |
|---|---|---|---|
| | 2019 (ආ) | 2020 (ඇ) | |
| **කාර්මික නිෂ්පාදන දර්ශකය** | **104.2** | **103.9** | **(0.3)** |
| ආහාර නිෂ්පාදන | 96.5 | 105.4 | 9.3 |
| ඇඟලුම් නිෂ්පාදන | 116.1 | 101.2 | (12.8) |
| අනෙකුත් ලෝහ නොවන ඛණිජ නිෂ්පාදන | 114.0 | 130.2 | 14.3 |
| පිරිපහදුකළ ඛණිජතෙල් නිෂ්පාදන | 106.0 | 106.7 | 0.7 |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 121.2 | 98.7 | (18.5) |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 94.7 | 85.9 | (9.3) |
| පාන වර්ග | 99.3 | 106.2 | 7.0 |

(අ) ප්‍රධාන උප අංශ 7

(ආ) සංශෝධිත (ඇ) තාවකාලික




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

| මාසය/වසර | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | | | | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මාර්. 2020 | පෙබ. 2020 | මාර්. 2019 | පෙබ. 2019 | මාර්. 2020 | පෙබ. 2020 | මාර්. 2019 | පෙබ. 2019 |
| දර්ශකය | 30.0 | 53.6 | 66.9 | 50.6 | 32.0 | 50.2 | 56.3 | 53.0 |







## 1.7 වැටුප් සහ සේවා නියුක්තිය

### 1.7.1 වැටුප් ප්‍රමාණ දර්ශක

| අයිතමය | 2020 මාර්තු | 2019 මාර්තු | % වෙනස |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන් (2012 = 100) | 178.5 | 162.2 | 10.1 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2012 = 100) | 186.7 | 176.1 | 6.0 |
| කෘෂිකර්මාන්ත | 194.0 | 187.4 | 3.5 |
| කර්මාන්ත | 187.8 | 177.7 | 5.7 |
| සේවා | 182.4 | 169.8 | 7.5 |



### 1.7.2 සේවා නියුක්තිය (අ)

| අයිතමය | 2018 සිව්වන කාර්තුව | 2019 සිව්වන කාර්තුව (ආ) | 2019 වාර්ෂික (ආ) |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 52.2 | 51.9 | 52.3 |
| සේවා වියුක්ති අනුපාතිකය | 4.6 | 4.5 | 4.8 |
| **අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන් (ඇ) (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)** | | | |
| කෘෂිකර්මාන්ත | 25.6 | 27.1 | 25.3 |
| කර්මාන්ත | 27.7 | 26.9 | 27.6 |
| සේවා | 46.7 | 46.1 | 47.1 |

(අ) වැඩ කරන වයසේ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි වේ.

(ආ) තාවකාලික

(ඇ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සේවා වියුක්ති අනුපාතිකය




බොරතෙල් මිල




### 1.8 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2019 | | | 2020 | | |
|---|---|---|---|---|---|---|
| | ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) | | ලං.ඛ.නි.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්)(අ) | ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) | | ලං.ඛ.නි.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්)(අ) |
| | බ්‍රෙන්ට් (පාදක මිල) | ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | | බ්‍රෙන්ට් (පාදක මිල) | ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | |
| ජනවාරි | 59.63 | 51.13 | 62.80 | 64.28 | 58.28 | 70.44 |
| පෙබරවාරි | 64.23 | 54.84 | 68.65 | 55.86 | 51.04 | 63.68 |
| මාර්තු | 66.97 | 58.08 | 70.97 | 34.63 | 31.42 | 37.67 |
| අප්‍රේල් | 71.45 | 63.76 | 75.59 | 26.46 | 19.03 | |
| මැයි | 70.49 | 61.09 | 74.76 | | | |
| ජූනි | 62.88 | 54.57 | 67.29 | | | |
| ජූලි | 64.31 | 57.61 | 68.73 | | | |
| අගෝස්තු | 59.76 | 55.10 | 64.78 | | | |
| සැප්තැම්බර් | 62.53 | 57.20 | 67.73 | | | |
| ඔක්තෝබර් | 59.54 | 53.98 | 66.06 | | | |
| නොවැම්බර් | 62.49 | 57.00 | 69.11 | | | |
| දෙසැම්බර් | 64.87 | 59.54 | 71.78 | | | |
| **දිනය** | **2019** | | | **2020** | | |
| මැයි 09 | 69.88 | 61.72 | | - | - | |
| මැයි 10 | 71.04 | 62.33 | | - | - | |
| මැයි 11 | - | - | | 30.42 | 24.17 | |
| මැයි 12 | - | - | | 29.95 | 24.35 | |
| මැයි 13 | 70.72 | 61.59 | | 29.49 | 25.40 | |
| මැයි 14 | 70.23 | 61.19 | | 29.05 | 25.28 | |
| මැයි 15 | 71.16 | 61.46 | | 31.04 | 27.39 | |

මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(අ) ලං.ඛ.නි.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං.ඛ.නි.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ සෘජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.නි.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ.

# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික

| අයිතමය | 2020 මැයි 15 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| **ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 5.50 | 6.00 | 8.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 6.50 | 7.00 | 9.00 |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල්අනුපාතිකය (AWCMR) (සතිපතා සාමාන්‍යය) | 5.93 | 6.41 | 8.41 |
| **ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (SLIBOR)** | | | |
| දින 1 | 5.95 | 6.43 | 8.44 |
| දින 7 | 6.15 | 6.68 | 9.05 |
| මාස 1 | 6.40 | 6.90 | 9.75 |
| මාස 3 | 7.05 | 7.41 | 10.19 |
| මාස 6 | 7.72 | 8.11 | 11.14 |
| මාස 12 | 8.51 | 9.00 | 11.85 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික** | | | |
| දින 91 | 6.74 | 6.84 | 8.52 |
| දින 182 | 6.83 | 6.90 | 8.88 |
| දින 364 | 6.94 | 7.00 | 9.18 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 9.31 | 9.41 | 12.15 |
| | 2020 මාර්. | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.20-7.50 | 0.25-8.25 | 0.20-8.50 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 0.95-15.00 | 3.50-15.00 | 4.00-15.00 |
| | 2020 අප්‍රේ. | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 7.77 | 7.90 | 8.97 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 9.51 | 9.65 | 11.15 |
| | 2020 මාර්. | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 8.22 | 8.55 | 11.42 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 8.44 | 8.82 | 11.79 |
| | 2020 මාර්. | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 13.22 | 13.36 | 14.49 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 12.19 | 12.54 | 14.64 |
| **ජාතික ඉතිරිකිරීමේ බැංකුව** | | | |
| | 2020 මාර්. | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 4.00 | 4.00 | 4.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 8.50 | 8.75 | 10.50 |

| භාණ්ඩාර බැඳුම්කර වෙන්දේසිය | වසර 02 මාස 08<br>2020 මැයි 12 | වසර 08 මාස 02<br>2020 මැයි 12 |
|---|---|---|
| පොලී අනුපාතිකය | 8.65 | 9.00 |
| බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය | 8.05 | 8.85 |

| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2020 මැයි 15 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2020 මැයි 15 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 9.48 | 9.53 | එච්එස්බීසී බැංකුව | 8.16 | 8.62 |
| මහජන බැංකුව | 9.74 | 9.60 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 9.03 | 9.20 |
| හැටන් නැෂනල් බැංකුව | 9.88 | 10.08 | සිටි බැංකුව | 9.38 | 8.61 |
| කොමර්ෂල් බැංකුව | 9.48 | 9.57 | ඩොයිෂ් බැංකුව | 8.55 | 9.11 |
| සම්පත් බැංකුව | 10.40 | 9.84 | හබීබ් බැංකුව (අ) | 9.35 | 9.35 |
| සෙලාන් බැංකුව | 10.15 | 9.83 | ඉන්දියන් බැංකුව | 10.14 | 10.14 |
| යූනියන් බැංකුව | 9.85 | 10.23 | ඉන්දියන් ඕවර්සීස් බැංකුව (අ) | 10.68 | 10.68 |
| පෑන් ඒෂියා බැංකුව | 12.00 | 11.50 | එම්සීබී බැංකුව | 10.08 | 10.08 |
| නේෂන් ට්‍රස්ට් බැංකුව | 9.89 | 9.89 | ඉන්දීය රාජ්‍ය බැංකුව | 8.01 | 8.01 |
| ඩීඑෆ්සීසී බැංකුව | 11.24 | 10.04 | පබ්ලික් බැංකුව (අ) | 10.00 | 10.00 |
| එන්ඩීබී බැංකුව | 10.17 | 10.20 | අයිසීඅයිසීඅයි බැංකුව (ආ) | - | - |
| අමානා බැංකුව | 9.60 | 10.21 | ඇක්සිස් බැංකුව (ආ) | - | - |
| කාර්ගිල්ස් බැංකුව (අ) | 11.88 | 11.88 | | | |

(අ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත . එබැවින් ආසන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සදහන් කර ඇත.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇක්සිස් බැන්ක් ලිමිටඩ් සහ අයිසීඅයිසීඅයි බැන්ක් ලිමිටඩ් හට ශ්‍රී ලංකාවේ සිදු කරන ව්‍යාපාර කටයුතු වසා දැමීමට , අදාළ බැංකුවල මව් සමාගම් විසින් සිදු කළ ඉල්ලීම් මුල් කරගෙන , කොන්දේසිවලට යටත්ව, අවසර ලබාදී ඇත. ඒ අනුව, මේ වන විට, මෙම බැංකුවලට මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීමද ඇතුලත්ව , බැංකු ව්‍යාපාරයේ නිරත වීම සඳහා අවසර නොමැත . මෙම බැංකු වෙත ලබාදී ඇති බලපත්‍ර, මෙරට ඔවුන්ගේ බැංකු ව්‍යාපාරය වසා දැමීමේ කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවලංගු කිරීමට නියමිතය .

## 2.2 මුදල් සැපයුම

| අයිතමය | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | 2020 මාර්. (අ) | මසකට පෙර (ආ) | වසරකට පෙර (ආ) | 2020 මාර්. (අ) | මසකට පෙර (ආ) | වසරකට පෙර (ආ) |
| සංචිත මුදල් | 1,013.8 | 963.3 | 962.9 | 5.3 | 0.0 | (3.4) |
| පටු මුදල් සැපයුම ($M_1$) | 964.8 | 866.2 | 853.6 | 13.0 | 7.5 | 1.5 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 7,335.9 | 7,081.6 | 6,550.0 | 12.0 | 9.4 | 9.2 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 8,098.2 | 7,793.0 | 7,253.3 | 11.6 | 8.4 | 9.8 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් (ඇ) | 62.7 | 126.8 | 30.6 | 104.8 | 232.5 | (71.2) |
| මුදල් අධිකාරීන් | 943.5 | 971.0 | 691.9 | 36.4 | 40.5 | (19.4) |
| වාණිජ බැංකු | (880.9) | (844.2) | (661.3) | (33.2) | (7.3) | 12.1 |
| දේශීය බැංකු ඒකක (DBUs) | (413.3) | (398.1) | (291.7) | (41.7) | (28.1) | 13.5 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | (467.6) | (446.1) | (369.6) | (26.5) | 6.3 | 11.0 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම් (ඇ) | 8,035.6 | 7,666.2 | 7,222.7 | 11.3 | 5.2 | 11.1 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 3,198.8 | 2,928.4 | 2,614.3 | 22.4 | 9.5 | 14.7 |
| මහ බැංකුව | 473.3 | 308.4 | 504.7 | (6.2) | (39.7) | 92.7 |
| වාණිජ බැංකු | 2,725.5 | 2,620.0 | 2,109.5 | 29.2 | 21.2 | 4.6 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 2,196.7 | 2,123.5 | 1,733.5 | 26.7 | 23.0 | 5.0 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 528.9 | 496.5 | 376.0 | 40.6 | 14.0 | 2.8 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 868.3 | 832.6 | 702.6 | 23.6 | 16.5 | 26.2 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 498.9 | 491.3 | 436.2 | 14.4 | 13.0 | 21.4 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 369.4 | 341.4 | 266.4 | 38.7 | 21.9 | 34.8 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 5,944.2 | 5,824.2 | 5,580.2 | 6.5 | 4.8 | 11.1 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 5,488.0 | 5,400.4 | 5,182.0 | 5.9 | 5.0 | 11.1 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 456.2 | 423.8 | 398.2 | 14.6 | 2.4 | 11.5 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | (1,975.7) | (1,919.0) | (1,674.4) | (18.0) | (15.6) | (23.4) |

(අ) තාවකාලික (ආ) සංශෝධිත (ඇ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) අදාළව










## 2.3 සංචිත මුදල්හි සතිපතා වෙනස

| අයිතමය | 2020 මැයි 14 | 2020 මැයි 06 | වෙනස |
|---|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 1,010,225.52 | 1,007,014.35 | 3,211.18 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| අයිතමය | 2020 මැයි 11 | 2020 මැයි 12 | 2020 මැයි 13 | 2020 මැයි 14 | 2020 මැයි 15 |
|---|---|---|---|---|---|
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 5.95 | 5.94 | 5.92 | 5.91 | 5.91 |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | 19,850 | 22,750 | 17,050 | 17,250 | 25,275 |
| **වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම්** | | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 6.08 | 6.06 | 6.06 | 6.01 | 6.07 |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | 6,909 | 5,988 | 6,926 | 2,443 | 7,273 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| අයිතමය | 2020 මැයි 11 | 2020 මැයි 12 | 2020 මැයි 13 | 2020 මැයි 14 | 2020 මැයි 15 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් මිලියන) | 307,111.21 | 307,111.21 | 307,111.21 | 307,111.21 | 307,111.21 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය - පොත් අගය (රුපියල් මිලියන) | 298,870.49 | 299,136.35 | 299,357.08 | 299,412.48 | 299,447.76 |

## 2.6 විවට වෙළඳ කටයුතු

| අයිතමය | 2020 මැයි 11 | 2020 මැයි 12 | 2020 මැයි 13 | 2020 මැයි 14 | 2020 මැයි 15 |
|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | 10.000 | | | 15.000 | 10.000 |
| කාල සීමාව (දින ගණන) | 7 | | | 7 | 3 |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | 3.800 | | | 4.000 | - |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | 3.800 | | | 4.000 | - |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 6.00 | | | 6.05 | - |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 6.05 | | | 6.10 | - |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | 6.03 | | | 6.08 | - |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | 5.000 | | | 5.00 | 5.00 |
| පියවීමේ දිනය | 2020 මැයි 11 | | | 2020 මැයි 14 | 2020 මැයි 15 |
| පරිණත වන දිනය | 2020 මැයි 18 | | | 2020 මැයි 21 | 2020 මැයි 18 |
| කාල සීමාව (දින ගණන) | 7 | | | 7 | 3 |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | 1.000 | | | 6.048 | 9.655 |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | 1.000 | | | 5.000 | 5.000 |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 6.29 | | | 6.10 | 6.17 |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 6.30 | | | 6.50 | 6.25 |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | 6.30 | | | 6.41 | 6.23 |
| **නිත්‍ය පහසුකම** | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 142.200 | 136.286 | 136.970 | 136.007 | 131.344 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 1.371 | 0.100 | 0.100 | 1.141 | 5.400 |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | 136.029 | 136.186 | 136.870 | 125.866 | 120.944 |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)**** | 83.664 | 79.021 | 79.705 | 81.566 | 67.644 |

**සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම්/ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි.

## 2.7 ණය කාඩ්පත් (අ)

| අයිතමය | | 2020<br>පෙබ. අවසානයට(ආ) | 2020<br>ජන. අවසානයට | 2019<br>දෙසැ. අවසානයට |
|---|---|---|---|---|
| මුළු සක්‍රීය කාඩ්පත් ගණන | | 1,853,716 | 1,838,877 | 1,829,927 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | | 18,371 | 29,935 | 18,538 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | | 1,835,345 | 1,808,942 | 1,811,389 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | | 120,878 | 121,832 | 121,489 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | | 31,818 | 31,778 | 31,386 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | | 89,060 | 90,054 | 90,103 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද (ආ) තාවකාලික

## 2.8 වාණිජ පත්‍රිකා නිකුතු (අ)

| අයිතමය (රු.බිලියන) | 2020<br>මාර්. අවසානයට(ආ) | 2020<br>පෙබ. අවසානයට (ආ) | 2019<br>දෙසැ. අවසානයට(ආ) |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) | 1.7 | 1.7 | 3.4 |
| නොපියවූ (කාලපරිච්ඡේදය අවසානය වනවිට) | 2.1 | 2.1 | 1.4 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව

(ආ) තාවකාලික







## 2.9 කොටස් වෙළඳපොළ

| අයිතමය | 2020 මැයි 15 දිනෙන් අවසන් වූ සතිය | 2020 මාර්තු 20 දිනෙන් අවසන් වූ සතිය (අ) | වසරකට පෙර |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය<br>(1985 = 100) (ASPI) | 4,439.04 | 4,571.63 | 5,259.70 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය<br>(2004 = 1,000) (S&P SL20) | 1,755.51 | 1,947.42 | 2,446.90 |
| දෛනික සාමාන්‍ය පිරිවැටුම(රු. මිලියන) | 1,921.93 | 420.76 | 616.90 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 2,066.54 | 2,128.27 | 2,475.40 |
| විදේශීය මිලදී ගැනීම්(රු. මිලියන) | 708.94 | 36.20 | 312.30 |
| විදේශීය විකිණුම් (රු. මිලියන) | 916.20 | 143.51 | 1,309.60 |
| ශුද්ධ විදේශ මිලදී ගැනීම් (රු. මිලියන) | (207.26) | (107.31) | (997.30) |

(අ) COVID-19 ව්‍යාප්තිය පාලනය සඳහා රට තුළ පැවති තත්ත්වය හේතුවෙන් 2020 මාර්තු මස 23 වැනි දා සිට 2020 මැයි 06 දක්වා කොටස් වෙළඳපොළ කටයුතු සිදු නොවුණි.

# රාජ්‍ය මූල්‍ය අංශය

## 3.1 රාජ්‍ය මූල්‍ය කටයුතු (රු. බිලියන)

| ශීර්ෂය | 2018 | 2019 (අ) |
|---|---|---|
| **ආදායම් සහ ප්‍රදාන** | **1,932.5** | **1,898.8** |
| ආදායම | 1,920.0 | 1,890.9 |
| බදු ආදායම | 1,712.3 | 1,734.9 |
| බදු නොවන | 207.7 | 156.0 |
| ප්‍රදාන | 12.5 | 7.9 |
| **වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම්** | **2,693.2** | **2,915.3** |
| පුනරාවර්තන | 2,089.7 | 2,301.2 |
| ප්‍රාග්ධන වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණය දීම් | 603.5 | 614.1 |

(අ) තාවකාලික




## 3.2 මධ්‍යම රජයේ නොපියවූ ණය (රු. බිලියන)

| ශීර්ෂය | 2018 වසර අවසානයට (ආ) | 2019 වසර අවසානයට (අ) |
|---|---|---|
| **සමස්ත දේශීය ණය** | **6,071.0** | **6,629.1** |
| එයින් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 746.9 | 873.9 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 4,197.3 | 4,606.2 |
| රුපියල් ණය | 24.1 | 24.1 |
| සමස්ත විදේශීය ණය | 5,959.5 | 6,402.4 |
| මධ්‍යම රජයේ සමස්ත නොපියවූ රාජ්‍ය ණය | 12,030.5 | 13,031.5 |

(අ) තාවකාලික

(ආ) සංශෝධිත




## 3.3 රාජ්‍ය සුරැකුම්පත් - ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික 2020 මැයි 13 දිනෙන් අවසන් වූ සතියට

| සුරැකුම්පත | පරිණත කාලය | ප්‍රාථමික වෙළඳපොළ (අ) | | ද්විතීයික වෙළඳපොළ (ආ) | | | |
|---|---|---|---|---|---|---|---|
| | | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය: මිලට ගැනීමේ අනුපාතිකය | විකුණුම් අනුපාතිකය | සාමාන්‍යය | පසුගිය සතියේ සාමාන්‍යය |
| භාණ්ඩාගාර බිල්පත් | මාස 03 | 6.74% | 6.84% | 6.71% | 6.51% | 6.61% | 6.75% |
| | මාස 06 | 6.83% | 6.90% | 6.89% | 6.70% | 6.79% | 6.90% |
| | මාස 12 | 6.94% | 7.00% | 7.06% | 6.93% | 7.00% | 7.16% |
| භාණ්ඩාගාර බැඳුම්කර | < වසර 02 | - | - | 7.45% | 7.34% | 7.39% | 7.59% |
| | < වසර 03 | 8.05% | - | 8.20% | 8.06% | 8.13% | 8.26% |
| | < වසර 05 | - | - | 8.69% | 8.59% | 8.64% | 8.78% |
| | < වසර 06 | - | - | 8.81% | 8.70% | 8.76% | 8.86% |
| | < වසර 08 | 8.85% | - | 8.99% | 8.87% | 8.93% | 9.06% |
| | < වසර 10 | - | - | 9.17% | 8.96% | 9.07% | 9.20% |
| | < වසර 15 | - | - | 9.33% | 9.03% | 9.18% | 9.34% |
| | < වසර 20 | - | - | 9.43% | 9.09% | 9.26% | 9.38% |
| | < වසර 30 | - | - | 9.60% | 9.29% | 9.45% | 9.53% |

(අ) 2020 මැයි 13 දිනෙන් අවසන් වූ සතිය තුළ සිදු වූ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු

(ආ) ද්විතීයික වෙළඳපොළ තුළ ඉදිරිපත්කල ඵලදා අනුපාතිකයන්ගේ මධ්‍යන්‍ය

**පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළදී භාණ්ඩාගාර බිල්පත්වල හා භාණ්ඩාගාර බැඳුම්කරවල ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාත අඩුවීමක් පෙන්නුම් කර ඇත.**

| සුරැකුම්පත | පරිණත දිනය | කූපන් අනුපාතිකය | ද්විතීයික වෙළඳපොළ: මෙම සතිය | ද්විතීයික වෙළඳපොළ: පසුගිය සතිය |
|---|---|---|---|---|
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 2020-ඔක්-04 | 6.250% | - | 44.42% |
| | 2021-ජූලි-27 | 6.250% | 46.24% | 38.91% |
| | 2022-ජන-18 | 5.750% | 45.37% | 38.90% |
| | 2022-ජූලි-25 | 5.875% | 36.81% | 32.06% |
| | 2023-අප්‍රි-18 | 5.750% | 32.28% | 27.26% |
| | 2024-මාර්-14 | 6.850% | 28.53% | 24.81% |
| | 2024-ජුනි-28 | 6.350% | 25.99% | 22.86% |
| | 2025-ජුනි-03 | 6.125% | 23.07% | 20.44% |
| | 2025-නොවැ-03 | 6.850% | 23.28% | 20.75% |
| | 2026-ජූලි-18 | 6.825% | 21.81% | 19.39% |
| | 2027-මැයි-11 | 6.200% | 19.59% | 17.69% |
| | 2028-අප්‍රි-18 | 6.750% | 19.15% | 17.33% |
| | 2029-මාර්-14 | 7.850% | 20.07% | 18.15% |
| | 2030-මාර්-28 | 7.550% | 18.62% | 17.00% |






## 3.4 රාජ්‍ය සුරැකුම්පත්- 2020 මැයි 13 දිනෙන් අවසන් වූ සතියට ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු සාරාංශය

| අයිතමය | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| නොපියවූ රාජ්‍ය ණය සුරැකුම්පත් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 1,122,538.62 | 1,117,976.62 |
| භාණ්ඩාගාර බැඳුම්කර [අ] | 4,927,950.08 | 4,830,924.84 |
| **එකතුව** | **6,050,488.70** | **5,948,901.46** |
| අනේවාසිකයින් සතු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර | 23,208.38 | 23,208.07 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 503,942.10 | 517,044.47 |

**පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළදී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය එතරම් වෙනස් වී නොමැති බව පෙන්නුම් කර ඇත.**

| ප්‍රාථමික වෙළඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | 30,000.00 | 30,000.00 |
| ලැබුණු ලංසු ප්‍රමාණය | 53,410.00 | 44,735.00 |
| පිළිගත් ලංසු ප්‍රමාණය | 30,000.00 | 19,265.00 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | 50,000.00 | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය | 85,455.00 | - |
| පිළිගත් ලංසු ප්‍රමාණය | 35,605.00 | - |

**මෙම සතිය තුළදී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය මෙන් 1.8 ගුණයක් හා භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය මෙන් 1.7 ගුණයක් විය.**

| ද්විතීයික වෙළඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 30,046.77 | 23,557.66 |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 176,217.63 | 178,098.40 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | |
| හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 53,389.63 | 79,881.05 |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 305,830.43 | 243,368.16 |

**පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළදී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය 7.73 ක ප්‍රතිශතයකින් වැඩිවීමක් පෙන්නුම් කර ඇත.**

(අ) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නිකුත් කරන ලද රු. මිලියන 56,662 ක් වන භාණ්ඩාගාර බැඳුම්කර ඇතුලත් වේ.

## 3.5 ද්වි පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බිල්පත්) -2020 මැයි 15

| පරිණතියට ඇති ඉතිරි කාලය | සාමාන්‍ය මිලට ගැනීමේ මිල | ඵලදා අනුපාතික % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතික % | ගැණුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|
| 1-7 දින | 99.88 | 6.39 | 99.88 | 6.17 | 0.00 |
| මාස 1 | 99.47 | 6.52 | 99.48 | 6.37 | 0.01 |
| මාස 2 | 98.92 | 6.59 | 98.94 | 6.47 | 0.02 |
| මාස 3 | 98.35 | 6.73 | 98.39 | 6.55 | 0.04 |
| මාස 4 | 97.77 | 6.79 | 97.83 | 6.62 | 0.06 |
| මාස 5 | 97.19 | 6.85 | 97.27 | 6.67 | 0.07 |
| මාස 6 | 96.62 | 6.88 | 96.70 | 6.70 | 0.08 |
| මාස 7 | 96.03 | 6.92 | 96.12 | 6.76 | 0.09 |
| මාස 8 | 95.42 | 6.96 | 95.53 | 6.80 | 0.11 |
| මාස 9 | 94.83 | 6.99 | 94.93 | 6.85 | 0.10 |
| මාස 10 | 94.23 | 7.02 | 94.33 | 6.90 | 0.10 |
| මාස 11 | 93.62 | 7.06 | 93.73 | 6.93 | 0.11 |
| මාස 12 | 93.05 | 7.05 | 93.17 | 6.93 | 0.12 |

### 3.6 ද්වි පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බැඳුම්කර) - 2020 මැයි 15

| භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩය | පරිණත කාලය (වසර ගණන) | පරිණත දිනය (දිනය/මාසය /වර්ෂය ) | පරිණතියට ඇති දින ගණන | සාමාන්‍ය මිලට ගැනීමේ මිල | ඵලදා අනුපාතික % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතික % | ගැණුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|---|---|---|
| 08.00%2020A | 8 | 2020 ජූනි 1 | 17 | 100.04 | 6.85 | 100.05 | 6.59 | 0.01 |
| 06.20%2020A | 10 | 2020 අගෝ. 1 | 78 | 99.82 | 6.91 | 99.88 | 6.66 | 0.05 |
| 09.50%2020A | 5 | 2020 දෙසැ. 15 | 214 | 101.41 | 6.98 | 101.50 | 6.83 | 0.09 |
| 10.75%2021A | 5 | 2021 මාර්තු. 1 | 290 | 102.80 | 7.04 | 102.90 | 6.92 | 0.09 |
| 09.00%2021A | 8 | 2021 මැයි 1 | 351 | 101.73 | 7.10 | 101.85 | 6.98 | 0.12 |
| 11.00%2021A | 7 | 2021 අගෝ. 1 | 443 | 104.35 | 7.18 | 104.47 | 7.08 | 0.12 |
| 09.45%2021A | 7 | 2021 ඔක්. 15 | 518 | 102.90 | 7.25 | 103.04 | 7.15 | 0.14 |
| 11.50%2021A | 5 | 2021 දෙසැ. 15 | 579 | 106.13 | 7.33 | 106.31 | 7.21 | 0.18 |
| 08.00%2022A | 10 | 2022 ජන. 1 | 596 | 100.68 | 7.54 | 100.87 | 7.41 | 0.19 |
| 10.70%2022A | 3 | 2022 මාර්තු. 15 | 669 | 105.14 | 7.63 | 105.35 | 7.51 | 0.21 |
| 11.20%2022A | 9 | 2022 ජූලි 1 | 777 | 106.63 | 7.75 | 106.90 | 7.62 | 0.26 |
| 10.00%2022A | 8 | 2022 ඔක්. 1 | 869 | 104.51 | 7.88 | 104.78 | 7.75 | 0.27 |
| 08.65%2023A | 3 | 2023 ජන. 15 | 975 | 101.38 | 8.06 | 101.69 | 7.93 | 0.32 |
| 10.00%2023A | 6 | 2023 මාර්තු. 15 | 1,034 | 104.52 | 8.17 | 104.86 | 8.04 | 0.34 |
| 11.50%2023A | 6 | 2023 මැයි 15 | 1,095 | 108.57 | 8.22 | 108.94 | 8.08 | 0.38 |
| 10.20%2023A | 5 | 2023 ජූලි 15 | 1,156 | 105.40 | 8.22 | 105.78 | 8.09 | 0.38 |
| 09.00%2023A | 10 | 2023 සැප්. 1 | 1,204 | 102.02 | 8.28 | 102.40 | 8.15 | 0.38 |
| 11.20%2023A | 9 | 2023 සැප්. 1 | 1,204 | 108.42 | 8.22 | 108.85 | 8.08 | 0.43 |
| 07.00%2023A | 20 | 2023 ඔක්. 1 | 1,234 | 96.32 | 8.26 | 96.71 | 8.13 | 0.38 |
| 11.60%2023A | 5 | 2023 දෙසැ. 15 | 1,309 | 109.88 | 8.35 | 110.24 | 8.24 | 0.36 |
| 11.40%2024A | 10 | 2024 ජන. 1 | 1,326 | 108.91 | 8.49 | 109.20 | 8.40 | 0.29 |
| 10.90%2024A | 5 | 2024 මාර්තු. 15 | 1,400 | 107.48 | 8.56 | 107.82 | 8.46 | 0.34 |
| 10.25%2024A | 5 | 2024 ජූනි 15 | 1,492 | 105.62 | 8.58 | 105.93 | 8.50 | 0.30 |
| 11.00%2024A | 8 | 2024 අගෝ. 1 | 1,539 | 108.14 | 8.65 | 108.51 | 8.55 | 0.37 |
| 09.85%2024A | 5 | 2024 සැප්. 15 | 1,584 | 104.41 | 8.60 | 104.75 | 8.51 | 0.33 |
| 06.00%2024A | 10 | 2024 දෙසැ. 1 | 1,661 | 90.25 | 8.64 | 90.64 | 8.53 | 0.39 |
| 10.25%2025A | 10 | 2025 මාර්තු. 15 | 1,765 | 105.79 | 8.75 | 106.19 | 8.65 | 0.40 |
| 09.00%2025A | 12 | 2025 මැයි 1 | 1,812 | 101.15 | 8.71 | 101.57 | 8.60 | 0.42 |
| 11.00%2025A | 10 | 2025 අගෝ. 1 | 1,904 | 109.34 | 8.73 | 109.86 | 8.61 | 0.52 |
| 10.35%2025A | 8 | 2025 ඔක්. 15 | 1,979 | 106.74 | 8.76 | 107.23 | 8.65 | 0.49 |
| 09.00%2026A | 13 | 2026 පෙබ. 1 | 2,088 | 100.72 | 8.83 | 101.24 | 8.72 | 0.52 |
| 05.35%2026A | 15 | 2026 මාර්තු. 1 | 2,116 | 84.41 | 8.84 | 84.88 | 8.73 | 0.47 |
| 11.00%2026A | 11 | 2026 ජූනි 1 | 2,208 | 109.94 | 8.84 | 110.51 | 8.72 | 0.57 |
| 11.50%2026A | 10 | 2026 අගෝ. 1 | 2,269 | 112.35 | 8.87 | 112.97 | 8.74 | 0.62 |
| 11.40%2027A | 8 | 2027 ජන. 15 | 2,436 | 112.27 | 8.91 | 112.91 | 8.79 | 0.64 |
| 11.75%2027A | 10 | 2027 ජූනි 15 | 2,587 | 114.57 | 8.93 | 115.25 | 8.81 | 0.68 |
| 10.30%2027A | 8 | 2027 ඔක්. 15 | 2,709 | 107.26 | 8.94 | 107.80 | 8.84 | 0.54 |
| 11.25%2027A | 10 | 2027 දෙසැ. 15 | 2,770 | 112.38 | 8.96 | 113.08 | 8.84 | 0.71 |
| 10.75%2028A | 10 | 2028 මාර්තු. 15 | 2,861 | 109.40 | 9.05 | 110.18 | 8.91 | 0.78 |
| 09.00%2028B | 15 | 2028 මැයි 1 | 2,908 | 99.69 | 9.06 | 100.41 | 8.93 | 0.73 |
| 09.00%2028A | 15 | 2028 ජූලි 1 | 2,969 | 99.84 | 9.02 | 100.55 | 8.90 | 0.71 |
| 11.50%2028A | 13 | 2028 සැප්. 1 | 3,031 | 114.05 | 9.05 | 114.81 | 8.93 | 0.76 |
| 13.00%2029A | 15 | 2029 ජන. 1 | 3,153 | 122.35 | 9.19 | 123.80 | 8.98 | 1.44 |
| 13.00%2029B | 15 | 2029 මැයි 1 | 3,273 | 123.08 | 9.17 | 124.48 | 8.97 | 1.40 |
| 11.00%2030A | 15 | 2030 මැයි 15 | 3,652 | 111.90 | 9.16 | 113.41 | 8.94 | 1.51 |
| 11.25%2031A | 12 | 2031 මාර්තු. 15 | 3,956 | 113.57 | 9.24 | 115.32 | 9.00 | 1.75 |
| 08.00%2032A | 20 | 2032 ජන. 1 | 4,248 | 90.88 | 9.30 | 92.81 | 9.01 | 1.94 |
| 09.00%2032A | 20 | 2032 ඔක්. 1 | 4,522 | 97.75 | 9.31 | 99.76 | 9.03 | 2.01 |
| 11.20%2033A | 15 | 2033 ජන. 15 | 4,628 | 113.92 | 9.30 | 116.44 | 9.00 | 2.53 |
| 09.00%2033A | 20 | 2033 ජූනි 1 | 4,765 | 97.62 | 9.32 | 99.75 | 9.03 | 2.12 |
| 13.25%2033A | 20 | 2033 ජූලි 1 | 4,795 | 128.87 | 9.38 | 132.00 | 9.04 | 3.13 |
| 09.00%2033B | 20 | 2033 නොවැ. 1 | 4,918 | 97.16 | 9.38 | 99.70 | 9.04 | 2.55 |
| 13.25%2034A | 20 | 2034 ජන. 1 | 4,979 | 129.22 | 9.40 | 132.44 | 9.06 | 3.23 |
| 10.25%2034A | 15 | 2034 සැප්. 15 | 5,236 | 106.89 | 9.36 | 109.71 | 9.03 | 2.83 |
| 11.50%2035A | 20 | 2035 මාර්තු. 15 | 5,417 | 117.08 | 9.35 | 119.92 | 9.03 | 2.84 |
| 10.50%2039A | 20 | 2039 අගෝ. 15 | 7,031 | 109.43 | 9.43 | 112.72 | 9.09 | 3.29 |
| 12.00%2041A | 25 | 2041 ජන. 1 | 7,536 | 121.88 | 9.55 | 125.10 | 9.25 | 3.22 |
| 09.00%2043A | 30 | 2043 ජූනි 1 | 8,417 | 94.68 | 9.58 | 97.53 | 9.26 | 2.85 |
| 13.50%2044A | 30 | 2044 ජන. 1 | 8,631 | 136.16 | 9.60 | 139.67 | 9.32 | 3.51 |
| 13.50%2044B | 30 | 2044 ජූනි 1 | 8,783 | 136.05 | 9.63 | 139.82 | 9.32 | 3.77 |
| 12.50%2045A | 30 | 2045 මාර්තු. 1 | 9,056 | 126.64 | 9.65 | 130.46 | 9.33 | 3.82 |

# විදේශීය අංශය

## 4.1 විනිමය අනුපාතික

| අයිතමය | 2020 මැයි 15 දිනෙන් අවසන් වූ සතිය | | | සාමාන්‍යය අනුපාතිකය | |
|---|---|---|---|---|---|
| (ඒකකයකට රුපියල්)(අ) | ගැනුම් මිල | විකුණුම් මිල | සාමාන්‍යය අනුපාතිකය | සතියකට පෙර | වසරකට පෙර |
| එ.ජ. ඩොලර් | 184.89 | 189.99 | 187.44 | 189.02 | 176.61 |
| ස්ටර්ලිං පවුම් | 225.06 | 232.79 | 228.93 | 235.38 | 228.14 |
| ජපන් යෙන් | 1.71 | 1.78 | 1.75 | 1.78 | 1.61 |
| යූරෝ | 198.74 | 206.38 | 202.56 | 205.13 | 197.97 |
| ඉන්දියානු රුපියල් (1) | | | 2.49 | 2.49 | 2.51 |
| වි.ගැ.හි. ( 2020 මැයි 14 දිනට ) | | | 255.71 | 259.12 | 244.30 |

| මහ බැංකුව විසින් සිදු කරන ලද මිලදී ගැනීම් සහ විකිණීම් (ආ)(එ.ජ. ඩොලර් මිලියන ) | 2020 අප්‍රේල් | මාසයකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| මිලදී ගැනීම් | - | - | 51.20 |
| විකිණීම් | 98.10 | 174.30 | 34.50 |

විනිමය අනුපාතික - මාසය අවසානයට




| අයිතමය | 2020 මැයි 15 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | 36.62 | 22.85 | 46.87 |
| (වාණිජ බැංකු අතර සිදුවන එතැන්, පසුදින සහ එදින ගනුදෙනු) | | | |
| ඉදිරි විනිමය ගනුදෙනු | | | |
| ඉදිරි විනිමය අනුපාතික (රු/එ.ජ. ඩොලර්) (2) | | | |
| මාස 1 | 188.44 | 190.76 | 177.16 |
| මාස 3 | - | - | 178.64 |
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | 33.68 | 33.68 | 24.66 |
| නොපියවූ ඉදිරි විනිමය ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) ( 2020 මැයි 14 දිනට) | 1,821.00 | 1,845.36 | 1,671.70 |

(අ) වාණිජ බැංකුවල සාමාන්‍ය මධ්‍යස්ථ අනුපාතිකය (පෙ.ව.9.30 ට පවතින)

(ආ) මාසය තුළ මහ බැංකුව විසින්, වාණිජ බැංකු වෙතින් වෙළඳපොළ මිලට සිදු කරනු ලබන සමස්ත විකිණීම් සහ මිලදී ගැනීම්

(1) මහ බැංකුවේ දෛනික විනිමය අනුපාතිකය (2) සැබෑ ගනුදෙනු මත පදනම් වූ සතියේ සාමාන්‍යය

## 4.2 සංචාරක සේවා සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

| අයිතමය | | 2019 අප්‍රේල් | 2020 අප්‍රේල් (අ) | 2019 ජන-අප්‍රේල් | 2020 ජන-අප්‍රේල් (අ) | % වෙනස |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් | සංඛ්‍යාව | 166,975 | _ | 907,575 | 507,311 | -44.1 |
| සංචාරක ඉපැයීම් | (එ.ජ. ඩොලර් මිලියන) | 314.7 (ආ) | _ (ඇ) | 1710.6 (ආ) | 956.2 (ඇ) | -44.1 |
| | (රුපියල් බිලියන) | 82.2 (ආ) | _ (ඇ) | 305.9 (ආ) | 174.0 (ඇ) | -43.1 |

| | | 2019 මාර්තු | 2020 මාර්තු (අ) | 2019 ජන-මාර්තු | 2020 ජන-මාර්තු (අ) | % වෙනස |
|---|---|---|---|---|---|---|
| විදේශ සේවා නියුක්තිකයන්ගේ | (එ.ජ. ඩොලර් මිලියන) | 571.4 | 492.1 | 1,617.2 | 1,600.3 | -1.0 |
| ප්‍රේෂණ ලැබීම් | (රුපියල් බිලියන) | 102.0 | 91.1 | 290.7 | 292.2 | 0.5 |

(අ) තාවකාලික

(ආ) 2019 වසරේදී සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය දින ගණන සහ දිනක් සඳහා වන වියදම පිළිබඳ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කළ සමීක්ෂණයේ ප්‍රතිඵල මත සංශෝධනය වී ඇත.

(ඇ) 2020 වසරේදී සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය දින ගණන සහ දිනක් සඳහා වන වියදම පිළිබඳ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන සමීක්ෂණයේ ප්‍රතිඵල මත සංශෝධනය විය හැකිය.

සංචාරක පැමිණීම්




විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්



### 4.3 2020 අප්‍රේල් මස 30 දිනට නිල සංචිත වත්කම් (අ)

| | |
|---|---|
| නිල සංචිත වත්කම් (එ.ජ. ඩොලර් මිලියන) | **7,179.9** |
| (1) විදේශ මුදල් සංචිත | 6,744.1 |
| (2) ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 65.3 |
| (3) විශේෂ ගැනුම් හිමිකම් | 0.5 |
| (4) රත්‍රන් | 369.0 |
| (5) අනෙකුත් සංචිත වත්කම් | 1.0 |

(අ) තාවකාලික

### 4.4 2020 මාර්තු මස 31 දිනට විදේශ සංචිත සහ විදේශ මුදල් ද්‍රවශීලතාවය (අ)

| නිල සංචිත වත්කම් (එ.ජ. ඩොලර් මිලියන) | |
|---|---|
| නිල සංචිත වත්කම් | **7,533.74** |
| (1) විදේශ මුදල් සංචිත | 7,125.38 |
| (අ) සුරැකුම්පත් | 4,808.49 |
| (ආ) මුළු මුදල් සහ තැන්පතු | 2,316.89 |
| (i) වෙනත් මහ බැංකු, පියවීම් සඳහා වන ජාත්‍යන්තර බැංකුව සහ ජා.මූ.අරමුදල වෙතින් | 2,223.22 |
| (ii) විදේශයන්හි පිහිටි වාර්තා කරන රට තුළ මූලස්ථානය පිහිටා ඇති බැංකු වෙතින් | 1.11 |
| (iii) වාර්තා කරන රටෙන් පිටත මූලස්ථානය පිහිටා ඇති බැංකු වෙතින් | 92.56 |
| (2) ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 65.31 |
| (3) විශේෂ ගැනුම් හිමිකම් | 0.50 |
| (4) රත්‍රන් | 339.71 |
| (5) අනෙකුත් සංචිත වත්කම් | 2.83 |

විදේශ සංචිත මගින් ඉදිරියේදී සිදුකළ යුතු කෙටිකාලීන ශුද්ධ ගෙවීම් (ආ) (එ.ජ. ඩොලර් මිලියන)

| අයිතමය | එකතුව | කල්පිරීම | | |
|---|---|---|---|---|
| | | මාසයක් ඇතුලත | මාස 1 ට වැඩි සහ මාස 3 දක්වා | මාස 3 ට වැඩි සහ වසරක් දක්වා |
| 1. විදේශ ණය, සුරැකුම්පත් සහ තැන්පතු | (5,504.04) | (416.70) | (1,212.48) | (3,874.86) |
| ගෙවීම් (–) ණය වාරික ආපසු ගෙවීම | (3,892.31) | (268.00) | (984.20) | (2,640.11) |
| පොලිය | (1,611.73) | (148.70) | (228.28) | (1,234.75) |
| ලැබීම් (+) ණය වාරික ආපසු ලැබීම | | | | |
| පොලිය | | | | |
| 2. විදේශ මුදලින් සහ දේශීය මුදලින් පවතින ඉදිරි ගිවිසුම් සහ අනාගත සුරැකුම්වල සමස්ත හිඟ සහ අතිරික්ත තත්ත්වය (විනිමය හුවමාරු ගිවිසුම්වල ඉදිරි ගනුදෙනු ද (forward leg) අන්තර්ගතව) | (341.00) | 20.00 | (22.00) | (339.00) |
| (i) හිඟ (–)(ඇ) | (621.00) | (85.00) | (197.00) | (339.00) |
| (ii) අතිරික්ත (+) | 280.00 | 105.00 | 175.00 | |
| 3. අනෙකුත් | (0.16) | (0.16) | | |
| ප්‍රතිමිලදී ගැනීම් හා සම්බන්ධ ලැබීම් (+) | | | | |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් (–) | (0.16) | (0.16) | | |

(අ) තාවකාලික (ආ) මෙහි මූලික වශයෙන් අන්තර්ගත වන්නේ ඉදිරියේ දී සිදුකළ යුතු ගෙවීම්ය .
(ඇ) ඉදිරි විනිමය හුවමාරු ගිවිසුම්වල වැඩි කොටසක් නොපියවා ඉදිරියට ගෙනයනු ලැබේ .

## 4.5 විදේශීය වෙළඳාම

| අයිතමය | එ.ජ. ඩොලර් මිලියන | | | රුපියල් මිලියන | | |
|---|---|---|---|---|---|---|
| | 2020[අ] ජන-පෙබ | 2019 ජන-පෙබ | % වෙනස | 2020[අ] ජන-පෙබ | 2019 ජන-පෙබ | % වෙනස |
| **අපනයන** | **1,993.3** | **2,019.3** | **(1.3)** | **361,749.3** | **364,433.9** | **(0.7)** |
| කෘෂිකාර්මික | 383.8 | 415.4 | (7.6) | 69,661.7 | 74,954.6 | (7.1) |
| කාර්මික | 1,602.6 | 1,595.9 | 0.4 | 290,837.7 | 288,048.4 | 1.0 |
| ආහාර, පාන හා දුම්කොළ | 72.1 | 88.6 | (18.6) | 13,087.5 | 16,021.2 | (18.3) |
| රෙදිපිළි හා ඇඟලුම් | 942.2 | 941.5 | 0.1 | 170,988.0 | 169,892.8 | 0.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 140.6 | 76.0 | 84.9 | 25,520.7 | 13,718.2 | 86.0 |
| සම් භාණ්ඩ හා රබර් නිෂ්පාදිත | 154.6 | 174.0 | (11.1) | 28,057.3 | 31,415.2 | (10.7) |
| වෙනත් | 293.1 | 315.8 | (7.2) | 53,184.1 | 57,001.0 | (6.7) |
| ඛනිජ අපනයන | 3.9 | 4.6 | (15.3) | 701.8 | 824.2 | (14.9) |
| වෙනත් අපනයන | 3.0 | 3.4 | (10.2) | 548.2 | 606.8 | (9.7) |
| **ආනයන** | **3,297.7** | **3,087.9** | **6.8** | **598,454.5** | **557,521.5** | **7.3** |
| පාරිභෝගික භාණ්ඩ | 699.0 | 560.4 | 24.7 | 126,857.1 | 101,184.0 | 25.4 |
| අන්තර් භාණ්ඩ | 1,846.0 | 1,787.1 | 3.3 | 335,010.8 | 322,665.7 | 3.8 |
| ආයෝජන භාණ්ඩ | 747.0 | 739.5 | 1.0 | 135,558.2 | 133,521.8 | 1.5 |
| වෙනත් | 5.7 | 0.8 | 580.4 | 1,028.3 | 149.9 | 585.9 |
| **වෙළඳ ශේෂය** | **(1,304.3)** | **(1,068.6)** | **-** | **(236,705.1)** | **(193,087.6)** | **-** |

(අ) තාවකාලික

ආනයන




අපනයන




වෙළඳ දර්ශක (2010= 100 )




තේ මිල (වෙන්දේසි)




සහල් මිල (ආනයනික)




බොරතෙල් මිල (ආනයනික)




## 4.6 වෙළඳ දර්ශක (2010= 100 ) (අ)

| අයිතමය | 2020 පෙබරවාරි (ආ) | පෙර මාසය (ආ) | පෙර වසර |
|---|---|---|---|
| මුළු අපනයන | | | |
| වටිනාකම | 137.6 | 139.9 | 136.6 |
| ප්‍රමාණය | 133.9 | 150.5 | 127.3 |
| ඒකක වටිනාකම | 102.8 | 92.9 | 107.3 |
| මුළු ආනයන | | | |
| වටිනාකම | 139.9 | 155.3 | 128.2 |
| ප්‍රමාණය | 157.5 | 173.1 | 143.2 |
| ඒකක වටිනාකම | 88.8 | 89.7 | 89.5 |
| වෙළෙඳ මිල අනුපාතය | 115.7 | 103.6 | 119.8 |

(අ) එ.ජ. ඩොලර්වලින් අගය කරන ලද (ආ) තාවකාලික

## 4.7 වෙළඳ භාණ්ඩ මිල ගණන්

| අයිතමය | 2020 (අ) පෙබරවාරි | 2019 පෙබරවාරි | % වෙනස | 2020 (අ) පෙබරවාරි | 2019 පෙබරවාරි | % වෙනස |
|---|---|---|---|---|---|---|
| | කි.ග්‍රෑම් 1ක් එ.ජ. ඩො. | | | කි.ග්‍රෑම් 1ක් රුපියල් | | |
| කොළඹ තේ වෙන්දේසි මිල | 3.33 | 3.26 | 2.16 | 604.54 | 582.55 | 3.77 |
| ආනයන (මි.ර.ගැ.) | මෙට්‍රික් ටොන් 1ක් එ.ජ. ඩො. | | | මෙට්‍රික් ටොන් 1ක් රුපියල් | | |
| සහල් | 506.90 | 525.90 | (3.61) | 92,034.30 | 93,996.39 | (2.09) |
| සීනි | 376.10 | 344.04 | 9.32 | 68,285.04 | 61,490.53 | 11.05 |
| තිරිඟු | 260.60 | 295.26 | (11.74) | 47,314.49 | 52,772.53 | (10.34) |
| | බැරලයක් එ.ජ. ඩො. | | | බැරලයක් රුපියල් | | |
| බොරතෙල් | 63.68 | 68.65 | (7.24) | 11,561.22 | 12,269.38 | (5.77) |

(අ) තාවකාලික